# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

53 A, ඩී.එස්.ෆොන්සේකා පාර, කොළඹ - 05, ශ්‍රී ලංකා
දුරකථන / ෆැක්ස් : 2556629 ඊ-මේල් : slpia@sltnet.lk / slpiaexco@gmail.com වෙබ් අඩවිය : www.slpia.lk

මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/213/20 ඔබේ අංකය :

සී.ඩී. වික්‍රමරත්න මහතා,
වැඩබලන පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

2020.10.22

**ප්‍රධාන පොලිස් පරික්ෂක නිලධරයන්ගේ උසස්වීම් සම්බන්ධව.**

දීර්ඝ කාලයක් උසස්වීම් නොලබා සිටින ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධරයන් හට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලබා ගැනීම සඳහා සංගමයේ මැදිහත් වීම අපේක්ෂාවෙන් විවිධ අවස්ථාවලදී සාමාජිකයින් විසින් යොමුකරන ලද ලිපි හේතුවෙන් ඔබතුමාවෙත ඒ පිළිබඳව අප සංගමය යොමුකල ලිපි පිළිබඳව නැවත අවදානය යොමුකරවමු.

මේ වන විට 2003 සිට 2015 වසර දක්වා කාලයන් තුල ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර සඳහා උසස්වීම් ලද නිලධරයන් සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස්වීම් ලැබීමට සුදුසුකම් සපුරා ඇති නමුත්, පවතින පුරප්පාඩු ප්‍රමානය හේතුවෙන් ඔවුනොවුන් අතර දැඩි තරගකාරීත්වයක් උද්ගතව ඇත.

මේ පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකර, 2020.07.03 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේදී ආරක්ෂක ලේකම් තුමා සමග පැවති සාකච්ඡාවේදී අප සංගමය විසින් කල යොජනාව පදනම් කර ගනිමින් ප්‍රාදේශීය කොට්ඨාශ සඳහා හඳුනාගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි නව සහකාර පොලිස් අධිකාරී තනතුරු පිහිටුවමින් 2003 වසරේ සිට 2015 වසර දක්වා වූ සියළු ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධරයන්ට උසස්වීම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පොලිස් පරික්ෂකවරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

නීතීඥ ප්‍රගීත් ප්‍රේමසිරි,
නීතිවේදී (ගෞරව),
පොලිස් පරික්ෂක,
ලේකම්,
පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමය.

නීතීඥ ප්‍රගීත් ප්‍රේමසිරි
නීතිවේදී (ගෞරව)
ගරු ලේකම්.
ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

පිටපත - 1. ආරක්ෂක ලේකම්තුමා / ආරක්ෂක අමාත්‍යාංශය. (කාරුණික දැන ගැනීම සඳහා)
2. ලේකම්තුමා / ජාතික පොලිස් කොමිෂන් සභාව (කාරුණික දැන ගැනීම සඳහා)